# 6 ඇදහිල්ලෙන් සුවය

ශු. ජොහාන් 4 : 46-54

කතානායක : ගලීලයේ කානා නම් ගමට වැදගත්කමක් එක් කරමින්, ජේසුස් වහන්සේ සිය ප්‍රථම දේව බල ප්‍රකාශනය එහි සරණ මංගල්‍යයක දී සිදුකළ බව ඔබ අසා ඇත. මෙන්න කානා නුවර සිදු වූ තවත් ප්‍රාතිහාර්යයක්.

තරුණයා : මෙවර දේව බල ප්‍රකාශනය අත්දකීමට අවස්ථාව ලැබුවේ කවුද?

කතානායක : ඔහු රාජ්‍ය නිලධාරියෙක්. හෙරොද් ඇන්ටිපස් රජුට සේවය කළ නිලධාරියෙක් බව පැහැදිලි වෙනවා. තම පුත්‍රයා රෝගාතුර ව කපර්ණවුමෙහි සිටි අතර ජේසුස් වහන්සේ ජුදයේ සිට ගලීලයේ කානා නම් ගමට වැඩම කළ බව ඔහුට අසන්නට ලැබෙනවා.

තරුණයා : ඉතිං ඔහු සිය පුත්‍රයා කපර්ණවුමෙහි සිට කානාහි සිටි ජේසුස් වහන්සේ වෙත රැගෙන ආවා ද?

කතානායක : නැහැ, ඔහු ම උන්වහන්සේ වෙතට ගියා. මොහොතක් සවන් දෙන්න. ඒ රාජ්‍ය නිලධාරියාගේ හා ජේසුස් වහන්සේගේ හමුවට.

රාජ්‍ය නිලධාරියා : මහතාණෙනි, මාගේ පුත්‍රයා රෝගාතුර ව මරණාසන්න ව කපර්ණවුමෙහි සිටිනවා, කරුණාකර ඇවිත් ඔහු සුව කළ මැනවි.

ජේසුස් වහන්සේ : ඔබ ලකුණුත් අරුම පුදුම දේත් දුටුවොත් මිස විශ්වාස කරන්නේ නැහැ.

රාජ්‍ය නිලධාරියා : මහතාණෙනි, මගේ දරුවා මිය යන්නට පෙර වඩින්න.

ජේසුස් වහන්සේ : යන්න ඔබේ පුත්‍රයා ජීවත් වෙනවා.

කතානායක : මේ රාජ්‍ය නිලධාරියා ජේසුස් වහන්සේගේ වචනය විශ්වාස කරමින් යන්නට ගියා. මග දී ඔහු හමුවන්නට පැමිණි ඔහුගේ දාසයන් හමුවුණා.

තරුණයා : ඔවුන් ඔහු හමුවන්නට පැමිණියේ ඇයි? විශේෂ හේතුවක් තිබුණා ද?



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කතානායක : ඔබ ම අසා දැනගන්න.

දාසයෝ : ස්වාමීනි ඔබේ පුත්‍රයා ජීවත් වෙනවා.

රාජ්‍ය නිලධාරියා : ඔහු සුව වන්නට පටන් ගත්තේ කොයි වේලාවේ ද? කරුණාකර මට කියන්න.

දාසයෝ: ස්වාමීනි, ඊයේ පස්වරු එකට පමණ උණ බැස්සා.

රාජ්‍ය නිලධාරියා : "ඔබේ පුත්‍රයා සුවපත් වන්නේ" යැයි එතුමා මට පැවසුවේ ඒ මොහොතේ දීයි. (තම සිතින් සිතා ගනියි)

කතානායක : මේ මහා සුවයේ ප්‍රාතිහාර්යය අත්දුටුවේ එම රාජ්‍ය නිලධාරියා පමණක් නොවෙයි. ඔහුත් ඔහුගේ නිවසේ සියලු දෙනාත් ජේසුස් වහන්සේ අදහා ගත්තා.

තරුණයා : ජේසුස් වහන්සේ ගලීලයේ දී මෙවැනි ප්‍රාතිහාර්ය බොහොමයක් සිදු කර තිබෙනවා නොවේ ද?

කතානායක : ඔව්, උන්වහන්සේ ජුදයේ සිට ගලීලයට පැමිණි පසු සිදු කළ දෙවන දේව බල ප්‍රකාශනය මෙයයි. උන්වහන්සේට සියලු ගෞරවය ද මහිමය ද වේවා!

අපි දැන් එම සිදුවීමෙන් අපගේ ජීවිතවලට ලද හැකි ආදර්ශ විමසා බලමු.

## රාජ්‍ය නිලධාරියාගෙන් විදහා දක්වුණු චරිත ලක්ෂණ

- බලය, සැප සම්පත් කෙතරම් හිමි වුව ද තම රෝගාතුර පුත්‍රයාගේ මරණාසන්න අවස්ථාවේ ඔහුට සුවය පතා විශ්වාසයෙන් උන්වහන්සේ වෙතට ළඟාවීම
- කපර්ණවුමෙහි සිට කානා නුවරට සැතපුම් 20ක් පමණ තිබුණ ද, ඒ දුරකතර ගෙවා දරුවාගේ සුවය අපේක්ෂාවෙන් ඔහු ජේසුස් වහන්සේ වෙතට පැමිණීම
- ඔහු ජේසුස් වහන්සේ පිළිබඳ ව දැන සිටි බැවින්, මේ වේදනාබර අවස්ථාවේ උන්වහන්සේට විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් ආයාචනය කිරීම
- තමා බලාපොරොත්තු වූ ආකාරයට උන්වහන්සේ ක්‍රියා නොකළ ද ඔහු උන්වහන්සේට විශ්වාසයෙන් කීකරු වීම.

මෙලෙස ජේසුස් වහන්සේ සුවය ගෙනෙන ජීවමාන දෙවියන් වහන්සේ බව ඔහු අත් දුටුවේ ය. ජේසුස් වහන්සේ සිදු කළ මහා ප්‍රාතිහාර්ය තුළ ස්වාමීන් වහන්සේගේ බල මහිමය අත්දුටහ. ගෙයි වැසි සියල්ලෝ ම උන්වහන්සේ අදහා ගැනීමේ ආශීර්වාදයට ඇතුළු වූහ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අපි ද රෝග පීඩාවලට මුහුණ දීමේ දි

- ජේසුස් වහන්සේ මනුෂ්‍යයා සුවපත් කරන දෙවියන් වහන්සේ බව විශ්වාස කරමු.
- විශ්වාසයෙන් උන්වහන්සේ වෙතට යොමු වෙමු.
- සුවය පතා උන්වහන්සේට යාච්ඤා කරමු.
- උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමු.
- උන්වහන්සේගේ බලවත් ප්‍රාතිහාර්ය අයැද සිටිමු.
- හදවතින් ම උන්වහන්සේට කීකරු වෙමු.
- ඇදහිල්ලෙන් ප්‍රාතිහාර්ය අත් දකිමු.
- අන් අයගේ අවශ්‍යතා ද ස්වාමීන් වහන්සේ වෙත ඔසවමු.

**ක්‍රියාකාරකම්**

1. ස්වාමීන් වහන්සේ තුළින් සුවය ලැබීමට නම් අප තුළ තිබිය යුතු ගුණාංග ලැයිස්තුවක් පිළියෙල කරන්න.
2. සුවයේ ආශීර්වාදය පතන ඔබගේ මිතුරකු / හිතවතෙකු වෙනුවෙන් යාච්ඤාවක් නිර්මාණය කරන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.